**අපස්මාර රෝහල හා සෞඛ්‍ය මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය - 2018**

---------------------------------------------------------------------------------------

අපස්මාර රෝහල හා සෞඛ්‍ය මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියෙහි, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල අතර 2008 මාර්තු 26 දින එලඹි අංක 7/477 හා 2015 ඔක්තෝබර් 30 දින එළඹි අංක 11/640 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ ජාතික රෝහලේ පරිශ්‍රයේ සම්පූර්ණ උපකරණ වලින් සමන්විත අපස්මාර රෝහලක් ඉදිකිරීම හා එක් එක් පළාත්වල, පළාත් සෞඛ්‍ය මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම ප්‍රකාරව, රු.මිලියන 3,000 කට සමාන සෞදි රියල් මිලියන 75 ක් සැපයීමට සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල මූලිකව එකඟවී තිබුණි. තවද, 2015 ඔක්තෝබර් 30 දිනැති අතිරේඛ ණය ගිවිසුමක් මගින් රු.මිලියන 1,800 කට සමාන සෞදි රියල් මිලියන 45 ක අතිරේක ණය මුදලක් සපයා තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2008 මාර්තු 26 දින ආරම්භ කර තිබුණු අතර, 2009 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලය 2018 දෙසැම්බර් 31 දින වන විට අවස්ථා 06 කදී දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

------

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය සහ එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

## 2.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

ලැබී ඇති තොරතුරු අනුව, 2014 අප්‍රේල් 03 දින නිමකිරීමට යෝජිතව තිබූ මහල් 08 කින් සමන්විත අපස්මාර රෝහල සඳහා වූ ගොඩනැගිල්ලේ කොන්ත්‍රාත් වැඩ දින 950 ක ප්‍රමාදයකින් පසු නිමකර තිබුණු අතර 2016 නොවැම්බර් 09 දින රජයේ අමාත්‍යාංශයට භාරදී තිබුණි. රෝහල මහජනයාගේ ප්‍රයෝජනය සඳහා 2017 ඔක්තෝබර් 24 දින විවෘත කර තිබුණි. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පළාත් සෞඛ්‍ය මධ්‍යස්ථාන 09 සඳහා වෛද්‍ය උපකරණ මිලදී ගැනීමට වැයකිරීමට එකඟවී ලබාගත් රු.මිලියන 1,690.65 කට සමාන සවුදි රියාල් මිලියන 45 ක් වූ අතිරේක ණය මුදල සම්පූර්ණයෙන්ම අපස්මාර රෝහලේ ගොඩනැගිලි ඉදිකිරීමට හා වෛද්‍ය හා අනෙකුත් උපකරණ මිලදී ගැනීමට වැය කර තිබුණි. | අරමුණු ඉටුකර ගැනීමට ප්‍රතිපාදන ඵලදායී ලෙස භාවිතා නොකිරීම. | අදහස් ඉදිරිපත් කර නැත. | ව්‍යාපෘති වියදම් සඳහා මූල්‍ය පාලනය දුර්වල වීමට හේතු විමර්ශනය කිරීම අවශ්‍ය වේ. |
| (ආ) | දිවයින පුරා පළාත් සෞඛ්‍ය මධ්‍යස්ථාන 09 ක් රු.මිලියන 6,295.72 කට සමාන සවුදි රියාල් මිලියන 161.25 ක වියදමින් ස්ථාපිත කිරීමට ව්‍යාපෘතිය විසින් සැලැසුම් කර තිබුණි. කෙසේ වුවද, බාහිර රෝගී සායන, රසායනාගාර සහ පුහුණු මධ්‍යස්ථාන ආදී කටයුතු වලින් සමන්විත සෞඛ්‍ය මධ්‍යස්ථාන 09 ක ඉදිකිරීම් කටයුතු 2018 දෙසැම්බර් 31 දින වන විටද ආරම්භ කරද නොතිබුණි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු නොවීම. | අදහස් ඉදිරිපත් කර නැත. | අසාර්ථක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇති වන අවදානම අවම කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ අසාර්ථකත්වය විමර්ශනය කිරීම අවශ්‍ය වේ. |

## 2.2 ව්‍යාපෘති අරමුණු වලට පටහැනි ගෙවීම්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| අපස්මාර රෝහල හා සෞඛ්‍ය මධ්‍යස්ථානවල උපකරණ ප්‍රසම්පාදනය සඳහා ණය ගිවිසුම තුළ වෙන්කර තිබුණු රු.මිලියන 1,075.90 කින් රු.මිලියන 337.26 ක් ව්‍යාපෘතියේ අරමුණු වලට අදාළ නොවන ජාතික රෝහලේ ස්නායු ශල්‍ය ඒකකයට වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය සඳහා උපයෝජනය කර තිබුණි. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා වෙන්කළ අරමුදල් භාවිතා නොකිරීම. | අදහස් ඉදිරිපත් කර නැත. | ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම සඳහා මුළු ව්‍යාපෘති ප්‍රතිපාදනයම අනිවාර්යෙන්ම භාවිතා කළ යුතුය. |

**2.3 නිෂ්කාර්ය සහ ඌන උපයෝජිත සම්පත්**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයෙ |
|---|---|---|---|
| අවිච්ඡින්න විදුලි පද්ධතිය (Uninterrupted Power System) ඇතුළු අත්‍යාවශ්‍ය අමතර කොටස් පිළිබඳ විස්තර ලංසු මුල් පිටපත් වල නොතිබීම හේතුවෙන්, රු.මිලියන 176 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 1.35 ක වියදමින් මිලදිගත් Positron Emission Tomography Scanner (PET) යන්ත්‍රය 2018 දෙසැම්බර් 31 දින වන විට මාස 18 කට අධික කාලයක් නිශ්කාර්යව පැවතුනි. තවද, පරිලෝකන යන්ත්‍රය සඳහා අවශ්‍ය "Radioactive Flideoxyglucose" නම් වූ අත්‍යාවශ්‍ය රසායන ද්‍රව්‍ය සැපයීම හා සැපයුම්කරු විසින් ලබාදීමට එකඟ වූ සේවාස්ථ හා විදේශ පුහුණු වැඩ සටහන් අදාළ රෝහල් නිලධාරීන්ට ලබාදීම 2018 දෙසැම්බර් 31 වන විට අවසන් කර නොතිබුණි. | වෛද්‍ය උපකරණ වලින් අපේක්ෂිත අරමුණු ඉටු නොවිය හැකි අතර යන්ත්‍රය භාවිතා නොකර වගකීම් කාලය ඉකුත් වීම. | අදහස් ඉදිරිපත් කර නැත. | අපේක්ෂිත අරමුණු සඳහා උපකරණ එහි උපරිම ධාරිතාවෙන් සම්පූර්ණයෙන්ම භාවිතා කළ යුතුය. |